# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,929 - 2015 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2015.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1142 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1144 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1144 |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1145 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1145 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1146 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 සැප්තැම්බර් මස 11 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## සූරියවැව ප්‍රාදේශීය සභාව

සූරියවැව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත තාක්ෂණ සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයන්හි පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරාපත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 1. | යන්ත්‍ර ක්‍රියාකරු | 02 | රා.ප.ච. 06/2006 (iv) PL2-2006 A අනුව මාසික රු.12,210-130 x10- 145x10 - 160x10 - 170x12- රු.18,600 | *අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා.පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් හය(6) සමත් වී තිබිය යුතු ය.<br><br>*අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br><br>* අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

*සේවයේ නියුක්ත කිරීම පිළිබඳ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
(2) පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග දකුණු පළාත් සභාව විසින් සූරියවැව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට ඔබ බැඳී සිටිය යුතුයි.

*බඳවා ගැනීමේ කොන්දේසි :*

(1) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(2) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(3) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03ක සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිය සහතික කළ යුතු ය.
(4) 2015.03.01 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදළ නොවේ.
(5) අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.
(6) දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
(7) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංරක්ෂණය කිරීමේ බලය සූරියවැව ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ.
(8) සේවා පළපුරුද්ද පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ආකාරය :*

අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2015.09.07 දිනට පෙර සභාපති, ප්‍රාදේශීය සභාව, සූරියවැව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් එවිය යුතු ය :-

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතිකය,
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිත)
(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
(5) වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය,
(6) තනතුරට අදළ නිපුණතා සහතිකයේ පිටපතක්.

අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ජේ. එරන්ද ජනක,
සභාපති,
සූරියවැව ප්‍රාදේශීය සභාව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*.................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————.

03. ස්ථිර පදිංචි ලිපිනය :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

05. විවාහක/අවිවාහක බව :——————.

06. (i) උපන් දිනය : ——————.

(ii) 2015.03.01 දිනට වයස :
අවුරුදු :—————— මාස :—————— දින :——————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

08. ජාතිය :——————.

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.

10. සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :——————.

11. අධ්‍යාපන සුදුසුකම් :——————.

12. සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර :
සේවය කළ තනතුර :——————. සේවය කළ ස්ථානය:——————. සේවය කළ කාලය :——————.

13. වෙනත් සුදුසුකම් :——————.

14. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී තිබේ ද ? :——————.

තිබේ නම් ඒ පිළිබඳ විස්තර :——————.

මෙම අයදුම්පත්‍රය මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරුවලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි. මම කිසිදු උසාවියකින් සාපරාදී වරදකට වරකදරු වී නොමැති බව ද, මාගේ සුපුරුදු අත්සන තබා සහතික කරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

08-608

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් කුට්ටි ගල් නිෂ්පාදන අංගනය 2017 දෙසැම්බර් මස 31 දින දක්වා කාල සීමාව සඳහා බදු ලබා දීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ. අදාළ ටෙන්ඩර් පත් 2015.08.21 දින සිට 2015.09.11 දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබාගත හැක. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්, පිටපත් 02කින් යුතුව, ලේකම්, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල ලිපිනයට 2015.09.14 දින පෙ.ව. 10.00 දක්වා ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. එදිනම පෙ.ව. 10.30ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර ඉල්ලුම්කරුවන්ට ඔහුගේ/ඇයගේ නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැක.

වැඩි විස්තර ප්‍රාදේශීය සභාවට පැමිණ හෝ පහත දුරකථන අංකය මගින් ලබාගත හැක :

037-2291075

එච්. ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2015 අගෝස්තු මස 21 වැනි දින,

08-459/1

---

# බඩු බාහිරාදිය විකිණීම්

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

### තහනමට ගන්නා ලද භාණ්ඩ වෙන්දේසියක් - පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් තහනමට ගන්නා ලද පහත භාණ්ඩ වෙන්දේසියක් 2015.09.14 දින පෙ. ව. 10.00 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පැවැත්වේ.

අදළ භාණ්ඩ 2015.08.21 දින සිට 2015.09.11 දින ප.ව. 3.00 දක්වා ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පරීක්ෂා කළ හැකි අතර, වෙන්දේසිය සඳහා ඉදිරිපත් වන සෑම ඉල්ලුම්කරුවෙක්ම 250.00 ක මුදලක් වෙන්දේසි දින පෙ.ව. 10.00ට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවීමෙන් පසු වෙන්දේසිය සඳහා ඇතුල්විය හැක. අදළ භාණ්ඩ මිලදී ගන්නා ගැනුම්කරුවන් විසින් එදිනම මුදල් ගෙවා අදළ භාණ්ඩ ප්‍රාදේශීය සභා භූමියෙන් ඉවත්කර ගත යුතුවේ.

වැඩි විස්තර පහත දුරකථනයෙන් විමසිය හැක.
037-2291075

| අනු. අංකය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | තක්සේරු වටිනාකම රු. ශත |
|---|---|---|---|
| 01 | දොර 01 ශීතකරණ | 01 | 14,500 0 |
| 02 | කුඩා වීදුරු ස්ටූල් | 01 | 1,800 0 |
| 03 | කුෂන් පුටු | 03 | 1,500 0 |
| 04 | ස්ටෑන්ඩ් විදුලි පංකා | 01 | 3,000 0 |
| 05 | විදුලි ජල පිල්ටර | 01 | 2,100 0 |
| 06 | ඉලෙක්ට්‍රොනික් බිම් තරාදි | 01 | 95,000 0 |
| 07 | රෙදි සෝදන යන්ත්‍ර | 01 | 9,500 0 |
| 08 | උණු වතුර හීටරය (නාන කාමර) | 01 | 13,000 0 |
| 09 | වායුසමන යන්ත්‍ර | 01 | 48,000 0 |
| 10 | අගල් 01 ජල නළ (ඇල්කතීන්) | අඩි 150 රෝල | 3,000 0 |

එච්. ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2015 අගෝස්තු මස 21 වැනි දින,

08-459/2

# පළාත් පාලන නිවේදන

## මාතර මහා නගර සභාව

මාතර මහා නගර සභා ආඥාපනත

මාතර මහා නගර සභාව විසින් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 159 වැනි වගන්තිය යටතේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පහත උපලේඛනයේ සඳහන් වීථියක හෝ ඉන් කොටසක යම් භාණ්ඩයක් වෙළඳාම් කිරීම හෝ වෙළඳම සඳහා තැබීම තහනම් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මාතර.

2015 ජූලි මස 29 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

01. අනගාරික ධර්මපාල මාවත දකුණුපස හා වම්පස මහානාම පාලම අසල සිට වල්ගම මහා නගර සභා සීමාව දක්වා
02. මහානාම පාලම අසළ සිට ගුණවර්ධන මාවත, තංගල්ල පාර, වම්පස හා දකුණුපස මහා නගර සභා සීමාව දක්වා
03. මහානාම පාලම අසළ සිට පරණ තංගල්ල පාර, වම්පස හා දකුණුපස තංගල්ල පාර දක්වා
04. මාතර තානායම අසළ සිට වෙරළ පාර වම්පස හා දකුණුපස බ්‍රවුන්ස් හිල් දක්වා
05. මාතර කොටුව ඇතුළත පාරවල් දෙපස
06. හක්මන පාර වම්පස හා දකුණු පස තුඩාව ජල පොම්පාගාරය දක්වා
07. අකුරැස්ස පාර වම්පස හා දකුණුපස මහා නගර සභා සීමාව දක්වා
08. රාහුල පාර වම්පස හා දකුණුපස පෙදෙස
09. දුම්රියපොල පාර වම්පස හා දකුණුපස පෙදෙස
10. පරණ ගාලු පාර මාතර බෝධිය අසළ සිට පඹුරණ ගාලු පාර දක්වා වම්පස හා දකුණුපස පෙදෙස
11. හක්මන පාර සිට බතුතා පර දක්වා (මාකට් පාර) වම්පස හා දකුණුපස පෙදෙස
12. බතුතා පාර වම්පස හා දකුණුපස පෙදෙස
13. මාතර මහ රෝහල ඉදිරිපිට ධර්මරත්න මාවත වම්පස හා දකුණුපස මහා නගර සභා සීමාව දක්වා
14. උයන්වත්ත ක්‍රීඩා පිට්ටනිය වට රවුම වම්පස හා දකුණුපස පෙදෙස

08-588

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## තලාව ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තලාව ප්‍රාදේශීය සභාවට අයවිය යුතු වරිපනම් ගෙවීම පැහැර හැරීම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 162 වගන්තිය ප්‍රකාර තලාව ප්‍රාදේශීය සභාව විසින් තහනමට ගත් පහත සඳහන් චංචල දේපල 2015 සැප්තැම්බර් මස 04 වැනි දින තලාව ප්‍රාදේශීය සභා කාර්යාල භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව එකී පනතේ අංක 163(1) වගන්ති ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

භාණ්ඩ විස්තරය

01. තේක්ක ලීයෙන් නිම කළ පාවිච්චි කරන ලද කව්ච්චි 01 යි.
02. තේක්ක ලීයෙන් නිමවන ලද පාවිච්චි කළ කුෂන් රහිත (සෝෆා) පුටු කට්ටල 01 යි.

එල්. ඩබ්. කේ. ශ්‍යාමලී ශිරාණි,
ලේකම්,
තලාව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 04 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය .

08-587

# විවිධ දැන්වීම්

## වරකාපොළ ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2016 වර්ෂය

1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2015 වර්ෂයෙහි ජූලි මස 28 වැනි දින පවත්වන ලද වරකාපොළ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

බී. ඒ. කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොළ ප්‍රාදේශීය සභාව.

2015 ජූලි මස 28 වැනි දින,
වරකාපොළ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය යටතේ වරකාපොළ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවෙහි නිරූපිත යම් කාරණයක් සඳහා වරකාපොළ සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2016 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් මාර්තු 31ට පෙර අයකළ යුතු යැයි යෝජනා කරමි.

### 1 වැනි උපලේඛනය

| *අනු. අංකය* | *බලපත්‍රයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු. 750 හා එහෙත් රු. 1,500 ඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| | *සාමාන්‍ය :* | | | |
| 1. | භෝජනාගාර/භෝජන ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | තේ හා කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | වතුර බෝතල් පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | එළවළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පළතුරු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | බත් කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කඩල, රටකජු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බුලත්විට, තැඹිලි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අයිස්ක්‍රීම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ගෘහ භාණ්ඩ අලෙවි කිරීම (ලී/වානේ) | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ෆොටෝ කොපි/බයින්ඩින්/ලැමිනේටින්/දුරකථන සේවා ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පරිගණක/යතුරු ලියන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සිල්ලර වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලොතරැයි අලෙවි කුටි පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සිංහල බෙහෙත් බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවි සලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | තේ කොළ ගබඩා කිරීමේ හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | යන්ත්‍ර භාවිතා නොකර ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගුවන් විදුලි යන්ත්‍ර, ටේප් රෙකෝඩර්, ටෙලිවිෂන් යන්ත්‍ර වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | සාප්පු බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | මෝටර් රථ, මෝටර් බයිසිකල් අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 750 හා එහෙත් රු. 1,500 ඉක්මවන විට රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට රු. ශ. |
|---|---|---|---|---|
| 26. | මානාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | රේඩියෝ අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ඇලුමිනියම් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | අවමංගල භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | මහන මැෂින් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ස්වර්ණාභරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | බයිසිකල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ලිපිද්‍රව්‍ය වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | තොග වශයෙන් සිගරට් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | මැටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | බුලත්/පුවක්/දුම්කොළ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ඇස් කණ්නාඩි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | මෝටර් බයිසිකල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | පුවත්පත්, සඟරා ආදිය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | කිරි හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | මසා නිම කළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | ක්‍රීඩා භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ඔරලෝසු වෙළඳාම් කරන හා අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පටිගත කිරීමේ හා තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | මල් පැළ හා මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | පොල් වෙළඳසැලක් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | සංචාරක කඩල අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ත්‍රීවීල් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | පළතුරු කඩයක් හෝ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | වීඩියෝ දර්ශන පට කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | කුළු බඩු විකිණීම හා පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | සීනිබෝල/ටොෆි/චොකලට් පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | ප්ලාස්ටික් භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | ප්‍රවෘත්ති පත්‍ර හෝ සඟරා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | රසකැවිලි නිෂ්පාදනය/රසකැවිලි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | පෞද්ගලික දන්ත සායනයක්/දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම(බටහිර) | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම(ආයුර්වේද) | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | විශේෂඥ වෛද්‍ය සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | පෞද්ගලික පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | පරිගණක මගින් මුද්‍රණ කටයුතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | පරිගණක යන්ත්‍ර අලුත් වැඩියා හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | ජංගම වෙළෙඳ රථයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | බයිට් පැකට් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | ආභරණ වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට | වාර්ෂික වටිනාකම රු 750 හා එහෙත් රු. 1,500 ඉක්මවන විට | වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |

## II වැනි උපලේඛනය

*අප්‍රසන්න ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 01. | සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ලේ හා අතුනු බහන් උණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | සම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | මාළු අයිස් දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | කෘතිම පොහොර සෑදීම සඳහා ගන්නා ද්‍රව්‍ය ගබඩා කිරීම සහ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | දුම්කොල ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කරවල වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | ප්‍රමාණයෙන් ටො. 01 ඉක්ම වූ සත්ත්ව ආහාර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කපු නූල් සායම් පෙවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කඩදාසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කුකුල් කෑම නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ලී පෙගවීම සඳහා කොටුපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | විනාකිරි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රානුසාරයෙන් සපත්තු හා පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | යන්ත්‍රානුසාරයෙන් මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ගල් ස්මාරක සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සම් බෑග් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ටින් කෑම, කිරි ආහාර වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ඇසිඩ් වර්ග නිපදවීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | කන්ටේනර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | දැන්වීම් පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | අශ්වබල 5-20ත් අතර වී මෝලක්, ඇඹරුම්හලක් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | අශ්වබල 20ට අධික වී මෝලක් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ලියවන පට්ටල් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | මැණික් කපන, ඔප දමන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | වාහන සඳහා බොඩි සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | දැව ගබඩා කිරීමේ හා වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | බ්ලොක් ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පැකට් කර ශීතකරණයේ බහා ලු මස් මාළු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*අන්තරාදායක ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 01. | යන්ත්‍රානුසාරයෙන් රබර් දුම් ගැසීම හා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කොප්පරා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | කබොක්, බොරළු, හෑරීමේ හෝ කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ගල්වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | කපාපු පොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට | වාර්ෂික වටිනාකම රු 750 හා එහෙත් රු. 1,500 ඉක්මවන විට | වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 08. | කොහු නිපදවීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සිසිල්බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | යන්ත්‍ර මගින් ක්‍රියාකරන ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | අම්ලකර වායු (ඔක්සිජන්) භාවිතා කරන යකඩ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | යන්ත්‍රානුසාරයෙන් ගඩොල් සහ උළු පිළිස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යන්ත්‍රවලින් හෝ අතින් ක්‍රියාකර නූල් කැටීමේ හෝ රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | රෙදිපිළි මෝස්තර නිර්මානය කිරීමේ හා පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | බ්ලොක් ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ලෑලි පෙට්ටි හෝ තේ පෙට්ටි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ගෝනි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | කුමන වර්ගයේ හෝ තෙල් ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | උළු හා ගඩොල් රැස් කිරීමේ ගබඩාවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | බෝට්ටු, පාරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | අයිස් ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ඇළුමිනියම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ගඩොල් හෝ උළු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

ඉහත සඳහන් ලේඛනයට අයත් නොවන යම් ව්‍යාපාරයක් වරකාපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්වාගෙන යන්නේ නම් ඒ සඳහා පහත සඳහන් තක්සේරුව මත බල පත්‍රයක් ලබාගත යුතුය.

| තක්සේරුව | මුදල රු. ශත |
|---|---|
| වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට | 500 0 |
| වාර්ෂික වටිනාකම රු. 750 හා එහෙත් රු. 1,500 නොඉක්මවන විට | 750 0 |
| වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට | 1,000 0 |

08-486/2

---

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

2016 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ වරකාපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 වර්ෂයේ ජූලි මස 28 වැනි දින පවත්වන ලද වරකාපොල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

බී. ඒ. කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2015 ජූලි මස 28 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වරකාපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ වූ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016 වර්ෂයේ පවත්වාගෙන යන

සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදයම මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයට ව්‍යාපාර බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

| *ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද*<br>*රු. ශත* |
|---|---|
| රු. 01 සිට රු. 6,000.00 දක්වා | නැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

මෙම ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර :

1. කොමිස් ඒජන්තවරුන්ගේ ව්‍යාපාර
2. වෙන්දේසිකරුවන්ගේ ව්‍යාපාර
3. බ්‍රෝකර්වරුන්ගේ ව්‍යාපාර
4. මුදල් ආයෝජකයින්ගේ ව්‍යාපාර
5. මුදල් ණයට දෙන්නන්ගේ ව්‍යාපාර
6. කොන්ත්‍රාත් කරුවන්ගේ ව්‍යාපාර
7. උකස් බඩු ගන්නවුන්ගේ ව්‍යාපාර
8. සැපයුම්කරුවන්ගේ ව්‍යාපාර
9. රක්ෂණ නියෝජිතයින්ගේ ව්‍යාපාර
10. ප්‍රවාහන සේවා සපයන්නන්ගේ හෝ නියෝජිතයින්ගේ ව්‍යාපාර
11. මෝටර් රථ වාහන සයිකල් වෙළඳාම් කරන්නන්ගේ ව්‍යාපාර
12. දේශීය විදේශීය බැංකු ආයතන
13. රක්ෂණ ව්‍යාපාර
14. පුද්ගලික ආරෝග්‍යශාලා
15. රැකියා ඒජන්සිකරුවන්ගේ ව්‍යාපාර
16. පුද්ගලික අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම
17. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම

08-486/1

---

## දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

**2016 වර්ෂය සඳහා පොළ ගාස්තු පැනවීම**

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 155 වන වගන්තිය හා උක්ත වගන්තිය සමග කියවිය යුතු එම ආඥා පනතේ 267 වගන්තිය ප්‍රකාරව යෙදුන වෙළඳ පොළවල් සහ ඉස්තාල, කරත්ත, ගවයන් ආදිය තබා ගැනීම සඳහා බලපත්‍ර අතුරු ව්‍යවස්ථාව යටතේ රත්මලාන පොදු වෙළඳපොලේ වෙළඳාම් කිරීම සඳහා පහත පරිදි දෛනික පොළ ගාස්තු, වැට් බද්ද අදළව 2016 වර්ෂයේ දී පනවා අය කිරීමට මහ නගර සභාව යෝජනා කරන්නීය.

*යෝජනාව*

*පොළ ගාස්තු (වැට් බද්ද ඇතුළුව) දිනකට*

| *විස්තරය* | *ගාස්තුව*<br>*රු. ශත* |
|---|---|
| 1. සාප්පු බඩු වෙළඳාම සඳහා | 100 0 |
| 2. මාළු පමණක් වෙළඳාම සඳහා | 100 0 |

| | විස්තරය | ගාස්තුව |
|---|---|---|
| | | රු. ශත |
| 3. | එළවළු ලැල්ලක් සඳහා | 50 0 |
| 4. | පළතුරු පමණක් විකිණීම සඳහා | 50 0 |
| 5. | පළා වර්ග පමණක් විකිණීම සඳහා | 25 0 |
| 6. | එළවළු/පළතුරු/පළා වර්ග මිශ්‍ර සිල්ලර බඩු | 50 0 |
| 7. | වෙනත් සුළු වෙළඳාම් සඳහා | 25 0 |
| 8. | වාහනයක් මගින් වෙළඳාම් කරයි නම් - | |
| | වෑන් රථයක් සඳහා | 250 0 |
| | ලොරි රථයක් සඳහා | 300 0 |

08-630/2

---

## දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2016 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2016 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2016 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර දෙහිවල- ගල්කිස්ස මහ නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

### වරිපනම් බදු පනවා අය කිරීම - 2016

මහ නගර සභා ආඥාපනතේ 230 වගන්තිය හා එහි අනු වගන්ති අනුව 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු වරිපනම් බදු ප්‍රතිශතය තීරණය කිරීම සලකා බැලීම පිණිස පහත සඳහන් වාර්තාව මුදල් කාරක සභාවට ඉදිරිපත් කිරීම මැනවි.

01. 2016 වර්ෂය සඳහා පනවා අයකරනු ලබන බදු ප්‍රතිශතය.

| | දේපල ස්වභාවය | ප්‍රතිශතය |
|---|---|---|
| *(i)* | වෙළඳ හෝ වාණිජ කාර්‍යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකමින් | 30% |
| *(ii)* | වෙළඳ හෝ වාණිජ නොවන කාර්‍යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකමින් | 6% |
| *(iii)* | මුඩු ඉඩම් හා හිස් ඉඩම් සඳහා වාර්ෂික වටිනාකමින් | 6% |

2013 වර්ෂයේ දී කරන ලද සමීක්ෂණය අනුව මුලු දේපල සංඛ්‍යාව 78,734 ක් පමණ වන අතර ඉන් වාණිජ දේපල 10,052 ක් ද, වෙළඳ හෝ වාණිජ නොවන කාර්‍යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන 63,508 විය. එමගින් රුපියල් දස ලක්ෂ 330.00 ක ආදායමක් අපේක්ෂා කර ඇත. (වාණිජ දේපල වලින් රුපියල් දස ලක්ෂ 200.00 ක් ද, නේවාසික දේපලවලින් රුපියල් දස ලක්ෂ 130.00 ක් ද වේ.)

02. අවසාන වරට තක්සේරු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක වූයේ 2013.01.01 දින සිට වන අතර එම වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 5ක් සඳහා දක්වා ඇති ප්‍රතිශෝධනයට අනුව වරිපනම් බදු අයකරනු ලබයි.

03. *(i)* ඉහත 01 හා 02 කරුණු සලකා 2016 වර්ෂය සඳහා වෙළඳ හෝ වාණිජ කාර්‍යයන් සඳහා භාවිතා කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකම 30% වාර්ෂික බදු ප්‍රතිශතකයක් ද, වෙළඳ නොවන කාර්‍යයන් සඳහා භාවිතා කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකම 6%ක වාර්ෂික බදු ප්‍රතිශතයක් ද, මුඩු ඉඩම් හා හිස් ඉඩම්වල වාර්ෂික වටිනාකම සඳහා 6%ක වාර්ෂික බදු ප්‍රතිශතයක් ද අය කිරීමට යෝජනා කරයි.

*(ii)* ඉහත 1 හි යෝජිත පරිදි ප්‍රතිශතයන්ට අනුව වරිපනම් බදු පැනවීමෙන් 2016 වර්ෂයේ දී වාණිජ කාර්‍යයන් සඳහා භාවිත කරනු ලබන දේපල වලින් රුපියල් දස ලක්ෂ 200.00 ක පමණ ආදායමක් ද, වෙළඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකම මත භාවිත කරනු ලබන දේපලවලින් රුපියල් මිලියන 130.00 ක පමණ ආදායමක් අපේක්ෂා කෙරේ.

*(iii)* වාර්ෂික වරිපනම් බදු මුදල් පහත පරිදි සමාන වාරික 4කින් අයකිරීමටත්, ගෙවීම් අවසන් වන දිනය සෙනසුරාද, ඉරිද හෝ රජයේ නිවාඩු දිනයක් වන්නේ නම් ඊට පෙර ඇති කාර්යාලයීය වැඩ කරන දිනය ඒ ඒ කාර්තු සඳහා වාරික ගෙවිය යුතු අවසන් දිනය ලෙස සැලකීමත් යෝජනා කෙරේ.

*(iv)* තවද අදළ කාර්තු තුළ ගෙවීම් නොකරන වරිපනම් බදු සඳහා ඊළඟ කාර්තුවේ සිට වෙළඳ හෝ වාණිජ නොවන කාර්‍යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන සඳහා භාවිත කරන දේපල හා මුඩු ඉඩම් හා හිස් ඉඩම්වල කාර්තු ගාස්තුවෙන් 15%ක වරෙන්තු ගාස්තුවක් අය කිරීමටත් ,වාණිජමය කාර්‍යයන් සඳහා භාවිත කරන දේපලවලින් වරෙන්තු ගාස්තුව ලෙස කාර්තු ගාස්තුවෙන් 20%ක් අය කිරීමටත් යෝජනා කරයි.

| | | |
|---|---|---|
| පළමු වාරිකය | - | 2016 මාර්තු 31 ට හෝ ඊට පෙර |
| දෙවන වාරිකය | - | 2016 ජුනි 30 ට හෝ ඊට පෙර |
| තුන්වන වාරිකය | - | 2016 සැප්තැම්බර් 30 ට හෝ ඊට පෙර |
| හතරවන වාරිකය | - | 2016 දෙසැම්බර් මස 31 ට හෝ ඊට පෙර |

08-630/9

## දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

### කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2016 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

### යෝජනාව

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව විසින් කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2016 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බව 1991 නොවැම්බර් මස 29 දිනැති *ගැසට් පත්‍රයේ* නිවේදනයට කරනු ලැබූ, අංක 541/17 දරන 1989.01.20 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශනයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් 2016 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන්ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම ඒ උපලේඛනයේ 2 වන කොටසේ 1 වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එකී 11 වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 247අ වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

එසේම 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්‍යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ හෝටලයක, ආපන ශාලාවක හෝ නවාතැන් පොළක පෙර වර්ෂයන් ලැබීම් මත සියයට 01% ක ගාස්තුවක් අයකරනු ලැබේ.

බලපත්‍ර ගාස්තු අයකර ගැනීමේ දී මේ වන විට ඉදිරිපත් කර ඇති යෝජනාවලට අමතර පහත කරුණු අමතර වශයෙන් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරමි.

01. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ කීපයකින් යුත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි කිහිපයක් එක් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු අයකරනු ඇත.

02. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාර හෝ කර්මාන්ත සඳහා යොදා ගෙන ඇති බිම් ප්‍රමාණයේ අනුපාතය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර බලපත්‍ර ගාස්තු වෙන වෙනම අයකරනු ඇත.

03. වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන විටදී එය එක් වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා බලපත්‍ර ගාස්තු අයකරනු ඇත. ගාස්තුව ගණනය කිරීමේ දී අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරුව අනුව බලපත්‍ර ගාස්තු තීරණය කරනු ඇත.

04. වරිපනම් අංක කිහිපයක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංකය එකට යාව පිහිටියේ වුව ද තම එක් එක් ව්‍යාපාර හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු අයකරනු ඇත.

05. එක් වරිපනම් අංකයක් යටතේ ව්‍යාපාර කීපයක පවත්වාගෙන යන්නේ නම් ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදා ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණයට අනුපාතව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර බලපත්‍ර ගාස්තු වෙන වෙනම අයකරනු ඇත.

### *උපලේඛනය*

#### I වැනි කොටස

1. ඌරන් ආදී සතුන් ඇති කිරීම.
2. මාළු විකිණීම.
3. මස් විකිණීම.
4. ඝාතකාගාරය.
5. කොණ්ඩා සකසන්නන්ගේ සහ බාබර්වරුන්ගේ සාප්පු සහ සැලූන් හල්.
6. හම්, බෙටි, ඇට, කුඩු හෝ පෝර හෝ විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන ද්‍රව්‍ය විකිණීම හෝ ගබඩා කිරීම.
7. ලොන්ඩරි.
8. ලැගුම් නිවාස.
9. හෝටල්.
10. බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ.
11. කිරි පට්ටි හා කිරි විකිණීම.
12. බේකරි.
13. අවමංගල්‍ය ශාලා සහ අවමංගල්‍ය කටයුතු භාරකරුවෝ.
14. සිසිල් බීම නිෂ්පාදනය.
15. අයිස් කර්මාන්ත ශාලා.
16. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම.
17. මිනිරන් ගබඩාකර තැබීම.
18. පොහොර නිෂ්පාදනය.
19. පොහොර ගබඩාකර තැබීම.
20. හම් ගබඩාකර තැබීම.
21. උම්බලකඩ හොණ්ඩර පහකට වැඩියෙන් ගබඩා කිරීම .
22. කුකුළු වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම.
23. කලුගල් කැඩීම සහ කබොක් කැපීම.
24. බොරලු හැරීම.
25. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳ පොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම.
26. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම.
27. රබර් සකස් කිරීම.
28. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූවිලි ඉවත් කිරීම.
29. පුවක් සකස් කිරීම.
30. තලාතු මිනිරන් සකස් කිරීම.
31. බැටළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම.

32. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
33. හුණු ගබඩාකොට තැබීම.
34. බොම්බයි ඵෑණු හොණ්ඩර 5 කට වඩා ගබඩාකොට තබා ගැනීම.
35. අර්තාපල් හොණ්ඩර් 5 කට වඩා ගබඩාකොට තබා ගැනීම.
36. පොල් කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩාකොට තබා ගැනීම.
37. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම.
38. පරණ ලෝහ ගබඩාකර තැබීම.
39. සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩාකර තැබීම.
40. කරවල හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
41. ලුණු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩාකාර තැබීම.
42. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම.
43. ට්‍රංක් පෙට්ටි නිෂ්පාදනය.
44. මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම .
45. ගම් වර්ග නිෂ්පාදනය.
46. විෂබීජනාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
47. බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කොට තබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
48. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
49. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
50. හිස් බෝතල් 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
51. කුරුඳු පොතු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
52. කොකෝවා හොණ්ඩර 10කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
53. මීනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම.
54. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම.
55. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හෝ ඔප දැමීම.
56. බලපත්‍රලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩාකොට තැබීම.
57. වේවැල් බඩු සෑදීම හෝ ගබඩාකොට තැබීම හෝ වේවැල් බඩු සෑදීම සහ ගබඩාකොට තැබීම.
58. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකොට තැබීම.
59. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
60. පිටි හෝ කුළු බඩු ඇඹරීම.
61. පුන්නක්කු හැර සත්ත්ව ආහාර හොණ්ඩර 20කට වඩා ගබඩාකොට තැබීම.
62. සත්ත්ව ආහාර හැර , වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම (සමුපකාර සමිති හැර).
63. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
64. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
65. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම.
66. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
67. පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ කර්ස්පෙක්ස් නිෂ්පාදනය සහ ගබඩා කර තැබීම.
68. ඇසිඩ් ගැළුම් 5කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
69. කපුරු නිෂ්පාදනය.
70. බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය.
71. ඉටිපන්දම් නිෂ්පාදනය.
72. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම.
73. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
74. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය.
75. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය.
76. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම.
77. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩාකොට තැබීම හෝ කෙඳි නිෂ්පාදනය සහ ගබඩාකොට තැබීම.
78. ගිනිපෙට්ටි නිෂ්පාදනය.
79. ඉඹුල් පුළුන් ගබඩාකොට තැබීම.
80. පොල් තෙල් ගැළුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
81. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩාකොට තැබීම.
82. ඇසිටිලීන් නිෂ්පාදනය.
83. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
84. ගඩොල් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
85. කබොක් ගල් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
86. සිගරට් නිෂ්පාදනය.
87. බීඩි නිෂ්පාදනය.
88. තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
89. ලී පෙට්ටි හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
90. කොහු නිෂ්පාදනය.
91. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි හැර වෙනත් ගෝනි 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
92. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම .
93. රස කැවිලි නිෂ්පාදනය.
94. පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
95. බෝට්ටු හෝ බත්තල් සෑදීම.
96. ලී පෙට්ටි සෑදීම.
97. ඔක්සිජන් සහ වැල්ඩින් වැඩ කරනු ලබන්නා වූ මෝටර් වාහන අළුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
98. මෝටර් වාහන අළුත්වැඩියා කරන්නා වූ ද, යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
99. මෝටර් වාහන අළුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
100. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
101. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ ද මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
102. අතින් හෝ පොලුවලින් ක්‍රියාකරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
103. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කොට තැබීම.
104. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
105. ගෙන්දගම් සහ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
106. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
107. 100 කට අධික ප්‍රමාණයක් පතුරොම් ගබඩා කොට තැබීම.
108. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ ගබඩා කොට තැබීම.
109. අළුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
110. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
111. ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
112. යාන්ත්‍රික ශීතකරණ සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
113. යන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ද ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
114. කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.
115. ඩ්‍රයි ක්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
116. යාන්ත්‍රික බලය පාවිච්චි නොකෙරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.

117. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද, වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
118. ගල් අඟුරු, ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
119. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය.
120. අශුද්ධ ලෝහ උණු කිරීම.
121. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.
122. කිලෝ ග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කොට තැබීම.
123. ගම්, ඉටි, හෝ දුම්මල (රෙසින් ) ගබඩා කිරීම.
124. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
125 තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
126. ශීතකරණ අළුත්වැඩියා කිරීම, රිකන්ඩිෂන් කිරීම හෝ පරික්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
127. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
128. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
129. පුපුරන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
130. සම්භාහන මධ්‍යස්ථාන හා සේවා.
131. ජාත්‍යන්තර පාසල්.
132. දේශීය හා බටහිර වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන.
133. සංනිවේදන කුළුණු පවත්වාගෙන යන ස්ථාන.
134. වර්ග අඩි 3,000ට වැඩි සාප්පු සංකීර්ණ.
135. සුරතල් සතුන් විකිණීම.
136. පෞද්ගලික අධ්‍යයන ආයතන.
137. සිනමා ශාලා හා රඟහල්.
138. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථාන.

**උපලේඛනය**

**2 වැනි කොටස**

| *I තීරුව* <br> *වාර්ෂික වටිනාකම* | *II තීරුව* <br> *ගෙවිය යුතු බද්ද (රු. ශත)* |
|---|---|
| 1. රු. 2,500 නොඉක්මවන අවස්ථාවක | 250 0 |
| 2. රු. 2,500 ඉක්මවන නමුත් රු. 4,000 නොඉක්මවන විට | 500 0 |
| 3. රු. 4,000 ඉක්මවන නමුත් රු. 10,000 නොඉක්මවන විට | 750 0 |
| 4. රු. 10,000 ඉක්මවන නමුත් රු. 25,000 නොඉක්මවන විට | 1,250 0 |
| 5. රු. 25,000 ඉක්මවන නමුත් රු. 35,000 නොඉක්මවන විට | 2,000 0 |
| 6. රු. 35,000 ඉක්මවන නමුත් රු. 50,000 නොඉක්මවන විට | 2,750 0 |
| 7. රු. 50,000 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 3,500 0 |
| 8. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,00,000 නොඉක්මවන විට | 4,250 0 |
| 9. රු. 1,00,000 ඉක්මවන විට | 5,000 0 |

08-630/10

---

**දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 247ආ වැනි වගන්තියෙන් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන්නා වූ කිසියම් කර්මාන්තයක් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයක් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙකුම, එකී කර්මාන්ත බද්ද 2016 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

ව්‍යාපාර බදු අය කර ගැනීමේ දී මේ වන විට ඉදිරිපත් කර ඇති යෝජනාවලට අමතරව පහත කරුණු අමතර වශයෙන් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරමි.

1. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි කිහිපයක් එක් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා ව්‍යාපාර බදු අයකරනු ඇත.

2. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාර හෝ කර්මාන්තය සඳහා යොදු ගෙන ඇති බිම් ප්‍රමාණයේ අනුපාතය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන විට දී එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයන් ලෙස සලකා ව්‍යාපාර බදු අයකරනු ඇත. ගාස්තුව ගණනය කිරීමේ දී අදළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරුව අනුව ව්‍යාපාරික බද්ද තීරණය කරනු ඇත.

4. වරිපනම් අංක කිහිපයක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංක එකට යාව පිහිටියේ වුව ද තම එක් එක් ව්‍යාපාර හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම ව්‍යාපාර බදු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ ව්‍යාපාර කීපයක් පවත්වාගෙන යන්නේ නම් ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදු ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණයට අනුපාතිකව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

උපලේඛනය

| I තීරුව | II තීරුව |
|---|---|
| වාර්ෂික වටිනාකම | ගෙවිය යුතු බද්ද (රු. ශත) |
| 1. රු. 2,500 නොඉක්මවන අවස්ථාවක | 250 0 |
| 2. රු. 2,500 ඉක්මවන නමුත් රු. 4,000 නොඉක්මවන විට | 500 0 |
| 3. රු. 4,000 ඉක්මවන නමුත් රු. 10,000 නොඉක්මවන විට | 750 0 |
| 4. රු. 10,000 ඉක්මවන නමුත් රු. 25,000 නොඉක්මවන විට | 1,250 0 |
| 5. රු. 25,000 ඉක්මවන නමුත් රු. 35,000 නොඉක්මවන විට | 2,000 0 |
| 6. රු. 35,000 ඉක්මවන නමුත් රු. 50,000 නොඉක්මවන විට | 2,750 0 |
| 7. රු. 50,000 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 3,500 0 |
| 8. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,00,000 නොඉක්මවන විට | 4,250 0 |
| 9. රු. 1,00,000 ඉක්මවන විට | 5,000 0 |

08-630/3

---

## දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 247ඇ වැනි වගන්තියෙන් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 247 ආ වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ ද කිසියම් ව්‍යාපාරයක් දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම, එකී ව්‍යාපාර බද්ද 2016 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

| I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|
| බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු. ශත |
| 1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. රු. 6,000 ඉක්මවන නමුත් රු 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

08-630/4

---

## දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)805 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

**2016 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම**

| විස්තරය | ගාස්තුව (වර්ග අඩියකට) සාමාන්‍ය රු. ශත | ප්‍රතිදීපන රු. ශත |
|---|---|---|
| 1. සාමාන්‍ය ව්‍යාපාර නාම පුවරුවක් සඳහා - | | |
| (i) වර්ග අඩි 50 දක්වා | ගාස්තු නැත | 50 0 |
| (ii) ව්‍යාපාර නාම පුවරු සඳහා වර්ග අඩි 50 ඉක්මවන්නේ නම් (සම්පූර්ණ වර්ගඵලයට) | 30 0 | 50 0 |
| (iii) සාමාන්‍ය වෙළඳ ව්‍යාපාරයක් වෙළඳ නාම පුවරුවක වෙනත් ආයතනයක හෝ භාණ්ඩයක හෝ සේවාවක් සඳහා පුළුල් ප්‍රදර්ශනයක් කරන්නේ නම් ඒවා අංක 02 යටතේ ගාස්තුවලට යටත් වේ. | | |
| 2. ගොඩනැගිලි මත හෝ භූමියක සවිකර ඇති ගුවන් පුවරුවක් හෝ බිත්තියක් මත සවි කර ඇති ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා - | | |
| (i) මධ්‍යම රජය මගින් නඩත්තු කරන මාර්ගවල සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය වන පුවරු සඳහා ගාස්තුව | | |
| වර්ග අඩි ප්‍රමාණය 100 ඉක්මවන විට | 150 0 | 200 0 |
| වර්ග අඩි ප්‍රමාණය 100 නොඉක්මවන විට | 100 0 | 150 0 |

| | *විස්තරය* | *ගාස්තුව (වර්ග අඩියකට)* *සාමාන්‍ය* *රු. ශත* | *ප්‍රතිදීපන* *රු. ශත* |
|---|---|---|---|
| (ii) | පළාත් සභාව මගින් නඩත්තු කරන පාරට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන පුවරු සඳහා ගාස්තු වර්ග අඩි ප්‍රමාණය 100 ඉක්මවන විට | 100 0 | 150 0 |
| | වර්ග අඩි ප්‍රමාණය 100 නොඉක්මවන විට | 50 0 | 75 0 |
| (iii) | අනෙකුත් අතුරු මාර්ගවල සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන පුවරු සඳහා ගාස්තු | 50 0 | 75 0 |
| 3. | එල්ඊඩී (LED) හෝ සමාන තාක්ෂණයක් භාවිත කරමින් චංචල දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන පුවරුවක් සඳහා වර්ග අඩි එකකට | | 400 0 |
| 4. | බිත්තියක් මත තීන්ත ආලේප කර ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා | 40 0 | 75 0 |
| 5. | ග්‍රැන්ට්‍රි ස්වභාවයේ පුවරුවක් සඳහා | 300 0 | 500 0 |
| 6. | වීථි නාම පුවරුවක් සඳහා එක් පුවරුවකට රු. 1,000 බැගින් ප්‍රචාරක ගාස්තු හැටියට ගෙවිය යුතු ය. (අවම වශයෙන් පුවරු 200ක්) | 400 0 | 500 0 |
| 7. | පෝස්ටර් ඇලවීම සඳහා සවි කරන පුවරු | 100 0 | 150 0 |

මෙම ගාස්තුව මාස 12 ක කාලයක් සඳහා වන අතර දැන්වීම් පුවරුව දෙපැත්තේම එක ම දැන්වීම ප්‍රදර්ශනය කරයි නම් දෙවන පැත්ත සඳහා නියමිත ගාස්තුවෙන් 25%ක් අය කරනු ලැබේ. පැති දෙක වෙනස් වූ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා යොදා ගනී නම් සම්පූර්ණ ගාස්තුව අයකරනු ලැබේ.

ගාස්තුව අය කිරීම සඳහා දැන්වීම් පුවරුවේ ප්‍රමාණය ලෙස සවි කිරීමට යොදා ගන්නා ආධාරකය හැර පුවරුවේ මුහුණත දිග සහ පළල සැලකිල්ලට ගනු ලැබේ.

ඉහත ගාස්තුවට අතිරේකව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු වේ.

| *ආකාශ කොඩි (බැනර්) සහ කටවුට්* | *ගාස්තුව (වර්ග අඩියකට)* *රු. ශත* |
|---|---|
| මුදල් ඉපයීමේ කාර්යයන් නොවන විට | 25 0 |
| මුදල් ඉපයීමේ කාර්යයන් සඳහා වන ආකාස කොඩි ආධාරකයක එල්ලා තබනු ලබන කටවුට් ඇතුළුව) | 75 0 |

මෙම ගාස්තු සති දෙකක කාලයක් සඳහා වන අතර, අතිරේකව සතියකට හෝ ඉන් කොටසකට 25% ක අතිරේක ගාස්තුවෙන් අය කරනු ලැබේ.

ඉහත ගාස්තුවලට අතිරේකව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු ය.

08-630/6

---

**දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**

2016 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 245 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 246 වැනි වගන්තිය සහ හතර වැනි උපලේඛනයේ විධිවිධානවලින් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ 2016 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක්, 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමට දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* *රු. ශත* |
|---|---|
| (1) (i) මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා | 25 0 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | | *රු. ශත* |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා – | |
| | *(අ)* එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 10 0 |
| | *(ආ)* එය වෙළඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම් | 5 0 |
| (iii) | සෑම කරත්තයක් ම සඳහා | 20 0 |
| (iv) | සෑම අත් කරත්තයක් ම සඳහා | 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් ම සඳහා | 7 50 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| (vii) | සෑම අලියකු ම සඳහා | 50 0 |

(2) රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා භාවිතා කෙරෙන අත් කරත්තයක් සහ වෙළඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත් කරත්තයක් මෙම ගෙවීම්වලින් නිදහස් කෙරේ.

**උපලේඛන අංක 02**

*විවිධ බලපත්‍ර ගාස්තු :*

| | *විස්තරය* | *ගාස්තුව* |
|---|---|---|
| | | *රු. ශ.* |
| 1. | වෙන්දේසි/බ්‍රෝකර් බලපත්‍රයක් සඳහා | 500 0 |
| 2. | සංචාරක වෙළඳ බලපත්‍රයක් සඳහා | 300 0 |
| 3. | දේපල උකස්කරයක් ලියාපදිංචි කිරීම සඳහා | 500 0 |
| 4. | සංදර්ශන බලපත්‍රයක් සඳහා | 300 0 |
| 5. | ඝෝගාතක බලපත්‍රයක් සඳහා | |
| | ගවයෙකුට | 300 0 |
| | එළුවෙකුට | 200 0 |
| 6. | ප්‍රසිද්ධ රැගුම් බලපත්‍රයක් සඳහා | 200 0 |

මෙම ගාස්තුවලට අමතරව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද අයකරනු ලැබේ.

**උපලේඛණ අංක 03**

වාහන ගාල් කිරීමේ ගාස්තුව (වැට් බද්ද ඇතුළුව)
(පැය 2ක කාලයක් ගාල් කිරීම සඳහා)

| | *විස්තරය* | *ගාස්තුව* |
|---|---|---|
| | | *රු. ශ.* |
| 1. | යතුරු පැදියක් සඳහා | 10 0 |
| 2. | මෝටර් කාර් එකක්/ත්‍රිරෝද රථයක් සඳහා | 15 0 |
| 3. | වෑන් රථයක්/මිනි බස් රථයක් සඳහා | 20 0 |
| 4. | ලොරියක් හා තනි දොර බස් රථයක් සඳහා | 50 0 |
| 5. | පාපැදියකට | 05 0 |
| 6. | සංචාරක බස් රථයක් සඳහා - දොර දෙක | 100 0 |
| | තනි දොර | 50 0 |

08-630/1

---

**දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**

2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

***2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම***

252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 247 ඇ වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක,

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක :

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2016 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2016 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

08-630/5

---

**දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

***2016 වර්ෂය සඳහා විනෝද බදු අය කිරීම***

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 25%ක විනෝද බද්දක් පනවා අය කිරීමටත්, එසේ වුව ද මහ නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා තුළ පෙන්වනු ලබන චිත්‍රපට සංදර්ශන සඳහා අයකරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 7.5%ක විනෝද බද්දක් පනවා අය කිරීමටත් 1946 අංක 12 දරන විනෝද බදු ආඥානතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් යෝජනා කරන්නීය.

08-630/7

---

**දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

**2016 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම**

මහ නගර සභා ආඥා පනතේ 247ඉ වගන්තිය ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින් බ්‍රෝකර්කරුවෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකුගේ නැතහොත් අනු නියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එසේ විකිණීමෙන් ලැබෙන මුදලින් 01%කට (සියයට එකක්) සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ අයදුම්කරු හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු විසින් ගෙවිය යුතු යැයි යෝජනා කරන්නීය.

08-630/8

---

**දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ජූලි මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(08)80 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2015 අගෝස්තු මස 03 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

2016 වර්ෂය සඳහා ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම හා ලිපිනයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම

**යෝජනාව**

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම හා ලිපිනයන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු 2016 වර්ෂයේ දී පනවා අයකිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ යොදා ඇති අතුරු ව්‍යවස්ථා කොටසේ 4 වන වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව යෝජනා කරන්නීය.

01. යම් ස්ථානයක් සඳහා ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම හා ලිපිනයන් එක් අවස්ථාවක් ලියාපදිංචි කිරීම වෙනුවෙන් රු. 1,000 (රුපියල් දහසක) මුදලක් බැගින් පනවා අය කිරීමට.
02. පදිංචිකරු ලෙස නම ඇතුළත් කිරීම සඳහා රු. 300 ක (රුපියල් තුන්සීයක) ගාස්තුවක් පනවා අය කිරීමට.
03. තෑගි (සමාන ඔප්පු ඇතුළත්ව), තෑගි අවලංගු කිරීමේ ඔප්පු, බෙදුම් ඔප්පු (විකුණුම්කරයක් ඇතුළත් වන අවස්ථාවලදී හැර), වැරදි නිවැරදි කිරීමේ ඔප්පු, හුවමාරු ඔප්පු, අද්මිනිස්ත්‍රාසි පැවරුම්කරය, (බූදල් නඩු තීරණ මත ලියන ලද ඔප්පු) හේතුවෙන් සිදු කරනු ලබන ඔප්පු සාරාංශ ලියාපදිංචි කිරීම්වලදී උක්ත ලියාපදිංචි ගාස්තුවෙන් 50%ක මුදලක් පමණක් අය කිරීමට.
04. ඉහත ගාස්තුවලට අතිරේකව එකතු කල අගය මත නියමිත බදු මුදල්ද ලිපිගොණු හා ලේඛන සැකසුම් ගාස්තු ලෙස තැන්පත් මුදලක් වශයෙන් නේවාසික දේපළ මත රු. 200ක් ද ව්‍යාපාරික දේපළ මත රු. 500ක් ද, පදිංචිකරු ලෙස නම ඇතුළත් කිරීම වෙනුවෙන් රු. 200ක් අය කිරීමට.

08-630/11

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.